ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

2021/10/14 චක්‍රලේඛන අංක 62/2021

සියලුම දිසා කොමසාරිස් වරුන් වෙත,

**ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ ප්‍රථම නායකත්ව පුහුණු පාඨමාලාව**
**මධ්‍යගත හා භෞතික ක්‍රමවේදය ඔස්සේ**
**2021-ඔක්තෝබර් 21 සිට 23 දක්වා**

**අරමුණ** : දේශීය හා ගෝලීය සමාජයට ධනාත්මක දායකත්වයක් දැක්විය හැකි මනා දැනුවත් බවින් යුතු ගුණාත්මක භාවයෙන් යුතු ජනාධිපති බාලදක්ෂයින් බිහි කිරීම.

**අභිමතාර්ථ** : මෙම පාඨමාලාව හැදෑරීමෙන් සහභාගීවන්නන් තුල පහත හැකියාවන් වර්ධනය වීම අපේක්ෂා කෙරේ.

- බාලදක්ෂ පොරොන්දුව හා නීතිය හා එහි තේරුම
- ශ්‍රී ලංකාවේ හා බාලදක්ෂ ව්‍යාපාරයේ ඉතිහාසය
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ වැදගත් කරුණු හා සිවිල් නීතිය පිළිබඳ දැනුවත්වීම.
- ළමා අයිතිවාසිකම් /ලෝක ළමා ප්‍රඥප්තිය, මිනිස් අයිතිවාසිකම්
- පරිසර හා පරිසර සංරක්ෂණය පිළිබඳ අවබෝධය
- පෞද්ගලික සංවර්ධනය හා එහි දියුණුව
- නායකත්ව ගුණාංග හා චරිතාංග
- සමාජීය/භෝජනගාර/ සංස්කෘතික හා ආගමික චර්යාධර්ම හා ගතිගුණ
- පෞද්ගලික සෞඛ්‍ය හා ශාරීරික ශක්තිය පිළිබඳ දැනුම
- සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමේ සූදානම හා මුහුණ දීම
- කථාවක් කිරීම සඳහා සූදානම
- තිරසාර සංවර්ධන ඉලක්ක
- දෛනික දිවියට බාලදක්ෂ ජීවය
- ජනාධිපති ප්‍රදානය දිනාගැනීම සඳහා සූදානම් වීම.

**සුදුසුකම්** :

- දිසා කොමසාරිස් ප්‍රධාන, දිනා වණවාසියාගේ ප්‍රදාන හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂ ප්‍රදානය සඳහා වන අවශ්‍යතා සපුරා ඇති බාලදක්ෂයින් (ප්‍රවීණතා පදක්කම් හා ධීරයා පදක්කම දිනා සිටීම අවශ්‍ය නැත)
- වයස අවු 15-18 අතර ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයකු විය යුතුය. 01.10.2021 දිනට
- එළිමහන් ක්‍රියාකාරකම් සඳහා සුදුසු කායික යෝග්‍යතාවයෙන් යුතු බවට වෛද්‍යවරයෙකු සහතික කර තිබිය යුතුය. (පාඨමාලාවට දින 7 ක් ඇතුලත)
- නේවාසික පාඨමාලාව ආරම්භයේ සිදු කරන වෛද්‍ය පරීක්ෂණයෙන් සුදුසුකම් සපුරාලිය යුතුය. (මාර්ගගත පාඨමාලාව සඳහා අවශ්‍ය නැත)
- නේවාසික පාඨමාලාව සඳහා රජයේ හෝ පෞද්ගලික ජීවිත රක්ෂණආවරණයක් තිබිය යුතුය.
- දෙමාපිය/භාරකරු/බාලදක්ෂ ආචාර්ය/විදුහල්පති /දිසා කොමසාරිස් අනුමැතිය ලබාගත යුතුය.
- තම බාලදක්ෂ දිසාවෙන් පැවැත්වූ පරීක්ෂණයකින් තෝරාගත් අයෙක් විය යුතුය.

ලියාපදිංචි කිරීම :

- දිසාවකින් ඕනෑම බාලදක්ෂ සංඛ්‍යාවක් තෝරා එවිය හැක.
- ප්‍රථම තේරීම ජාතික මුලස්ථාන මට්ටමින් සිදුකෙරේ.
- දිසා කොමසාරිස් තුමා විසින් බාලදක්ෂයින්ගේ නාමයෝජනා අයදුම්පත සමඟ 2021.10.15 දිනට පෙර ඊමේල් මඟින් හා තැපෑලෙන් එවිය යුතුය.

Email : slscout3@yahoo.com

Fax : 011 2433131

**තැපැල් ලිපිනය**

ජාතික වැඩ සටහන් කොමසාරිස්,
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 2.

අතින් භාරදීම : කාව්‍යා නෙත්මිණී

වැදගත් : කිසිදු කඳවුරු ගාස්තුවකින් හෝ ලියාපදිංචි ගස්තුවක් අය නොකෙරේ.

**ලැබෙන අවස්ථා :** සියළුම සහභාගිවන්නන්ට පාඨමාලා ආචාර්ය මණ්ඩලේ ඇගයීමට සරිලන ජාතික මුලස්ථානයෙන් නිකුත් කරණ සහතිකයක් හිමිවේ. සහභාගීවන්නන්ට වණවාසියාගේ රුහුණ හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂ ප්‍රදානය සම්පූර්ණකර ගැනීමට අවස්ථාව ලැබේ.

**අයදුම්කරන්නේ කෙසේද ? සූදානම් වීම හා රැගෙන ආයුතු දේ,**

- පාඨමාලා අයදුම්පත මඟින් 16 දිනට පෙර එවන්න
- ශරීර සුවතාවය පවත්වාගෙන යාම.
- අංග සම්පූර්ණ නිවැරදි නිලඇඳුම සුදානම් කර ගන්න.
- පාඨමාලාව ආරම්භයේදි ප්‍රථම ඇගයීමට මුහුණදීම සඳහා සුදානම් වන්න.

**පහත සඳහන් ලිපි ද්‍රව්‍ය/උපකරණ/පාඨමාලාවට වාර්තා කිරීමේදි තමා ලග තිබිය යුතුය.**

- ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ නිල ඇඳුම
- ලොග් පොත
- සටහන් පොත (පිටු 80) මොනිටර් පොත
- තද නිල් වර්ණ ට්‍රැක් බොටම් 01
- සුදු කැන්වස් සපත්තු කුට්ටමක්
- සුදු ඇද ඇතිරිලි 2 ක් අඩි 5' x 7'
- සුදු කොට්ට උරයක්
- තද නිල් ටයි පටියක්
- සුදු පාට කමිසයක් (අත් දිග)
- කළු පාට බ්ලේසරයක්

- ඔබගේ සහජ දක්ෂතා පෙන්වීමට අවශ්‍ය උපකරණ /සංගීත භාණ්ඩ ආදිය
- භාවිතා කරණ ඖෂධ - මාර්ග ගත පාඨමාලා වසඳහා අවශ්‍ය නැත.
- පෞද්ගලික ඇඳුම් පැලඳුම්
- සුදු පාට අත් පිස්නයක් (අඟල් 18" x 18")
- සුදු පාට මේස රෙද්දක් (අඩි 4 x අඩි 7)
- ස්ටෙන්ලස් ස්ටීල් ගෑරුප්පු 01/මේස හැන්දක්/මේස පිහියක්/ බටර් පිහියක්/ඩෙසට් පිහියක් /ඩෙසට් හැන්දක්/සුදු සෙරමික් පිගානක්/සුදු පැති පියනක්
- ඔබගේ නිවසේ භෝජනාගාර මේසයක් සැකසීම සඳහා අඩි 4'x4' හෝ ඊට වැඩි ප්‍රමාණයේ මේසයක් හා තනි ඇඳක් (Single Bed) ඔබගේ පරිගණකය මගින් පෙන්විය හැකි පරිදි සුදානමම්කර තබාගන්න.
- අඩි 5 1/2 යෂ්ටි 2 ක්, ලණු කැරැල්ලක්, පිරිසිදු කල වැටහිර ලී අඩි 6' කිහිපයක්
- ත්‍රිකෝණ වෙලුමක්

පාඨමාලාව සඳහා වාර්ථා කිරීම :

- සියළුම සහභාගීවන්නන් 2021.10.21 දින පෙ.ව.09.00 Zoom මගින් සම්බන්ධවිය යුතුය.
- Zoom Link එක ඊමේල් මගින් /වට්ස් ඇප් මගන් දැනුවත් කරනු ලැබේ.

2021.10.21 පෙ.ව 10.00 ට තාවකාලීන ආරම්භය - සුදානම් වීම, නීතිරීති

2021.10.21 ප.ව 2.00 - ප.ව 3.00 - සාමාරම්භක උළෙල

2021.10.23 ප.ව 8.00 - ප.ව 10.00 - සමාප්ති උළෙල

**සියළුම සහභාගී වන්නන් දින 3 පුරාම සියළු සැසි වලට සහභාගී විය යුතුය.**

අනාගතයේදි මෙම පාඨමාලාව හැදෑරීමේ ජනාධිපති ප්‍රදානය සඳහා අත්‍යාවශ්‍ය සුදුසු කමක් වනු ඇත. සෑම දිසාවකින්ම අවම වශයෙන් බාලදක්ෂයන් දෙදෙනෙකුවත් සහභාගී කරන ලෙස දිසා කොමසාරිස් වරුන්ගෙන් ඉල්ලුම් කෙරේ.

ස්තුතියි.

මෙයට,

බාලදක්ෂ සේවයේ නියුතු

**සරත් මාතරආරච්චි**
ජාතික වැඩ සටහන් කොමසාරිස්

**ජනප්‍රිත් ප්‍රනාන්දු**
ප්‍රධාන කොමසාරිස්

පිටපත් : සභාපති/ කමිටු සභාපති/භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සියළුම මුලස්ථාන කොමසාරිස්වරු (කා.දැ.පි)

සටහන : විශේෂ අවශ්‍යතා සහිත බාලදක්ෂයින් සඳහා වෙනම පාඨමාලාවන් සංවිධානය කෙරේ.